www.agaram.lk

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 6 ශ්‍රේණිය

## ඉතිහාසය

**නම/විභාග අංකය :-- .......................................................................................** **කාලය : පැය 02 යි.**

### I කොටස

- **මෙම කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.**
- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(1) අතීත කාලයේ සිට ජීවත් වූ ............................................. පිළිබඳ කථාව ඉතිහාසයයි. (සත්වයින්, මිනිසුන්, උගතුන්)

(2) අතීත කාලවල මිනිසුන් විසින් කළ කී දෑ පිළිබඳ දැන ගැනීමට ඉවහල් වන දෑ ............................................. වේ. (මූලාශ්‍ර, පොත්පත්, පුරාවිද්‍යා මූලාශ්‍ර)

(3) බුද්ධ පරිනිර්වාණය සමග ............................................. ආරම්භ වේ. (ක්‍රිස්තු වර්ෂ, බුද්ධ වර්ෂ, ශක වර්ෂ)

(4) අප ජීවත් වන පෘථිවියේ මුලින් ම ජීවීන් බිහි වූයේ ............................................. ය. (ජලයේ, ගොඩබිම, කඳුකරයේ)

(5) සතුන්ගේ ඇටකටු භාවිත කරමින් නිවාස ඉදි කරන ලද්දේ ............................................. මානවයාය. (හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ හැබිලස්, හෝමෝ නියන්ඩතාලන්සිස්)

- අංක 06 - 10 තෙක් ප්‍රකාශ කියවා නිවැරදි නම් 3 ලකුණ ද වැරදි නම් X ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(6) අතීතයේ මිනිසුන් භාවිත කළ මෙවලම්, පැරණි ගොඩනැගිලි පිළිම ආදිය පුරා විද්‍යා මූලාශ්‍ර වේ. (...........)

(7) ලෝකයේ පැරණි ම අක්ෂර පද්ධතිය නිර්මාණය කළේ මෙසොපොතේමියානු වැසියන් විසිනි. (...........)

(8) විජය කුමරු ඇතුලු පිරිස ගොඩ බසින ලද්දේ තම්බපණ්ණි ප්‍රදේශයටය. (...........)

(9) පෘථිවිය සෑදී ඇත්තේ අහසේ තිබූ නිහාරිකාවක් මගින් බව විද්‍යාඥයින්ගේ මතයයි. (...........)

(10) මුල් වරට රබර් බෝලයක් නිපදවීමේ ගෞරවය හිමි වන්නේ ඊජිප්තු වැසියන්ට ය. (...........)

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිත කිරීම පිළිබඳ සාක්ෂි ලැබෙන්නේ,
(i) චීනයෙනි (ii) ඉන්දියාවෙනි
(iii) ඊශ්‍රායලයෙනි (iv) තුර්කියෙනි

(12) පෘථිවියේ බිහි වූ ජීවයක් සහිත පළමු බැක්ටීරියාව හඳුන්වන්නේ,
(i) ඔපබීනියා (ii) නිහාරිකාව
(iii) ප්‍රොකායෝට් (iv) ඔස්ට්‍රලෝපිතස්

(13) වෙඩි බෙහෙත්, කඩදාසි හා මුද්‍රණ යන්ත්‍රය ආදිය ලොවට හඳුන්වා දුන්නේ,
(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයයි. (ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයයි.
(iii) චීන ශිෂ්ටාචාරයයි. (iv) ඊජිප්තු ශිෂ්ටාචාරයයි.



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

(14) පරිනාමයට පත් වූ මානවයන්ගේ ස්ථිර වාසස්ථාන සහිත ගම්මාන බිහි වන්නේ,

(i) මහා හිම යුගයේ ය. (ii) සිලූරියන් යුගයේ ය.
(iii) නව ශිලා යුගයේ ය. (iv) මධ්‍ය ශිලා යුගයේ ය.

(15) නිවාසවල භාවිත කළ දියුණු ජල නල පද්ධතියක් හමු වී ඇත්තේ,

(i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයෙනි. (ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙනි.
(iii) ඊජිප්තු ශිෂ්ටාචාරයෙනි. (iv) චීන ශිෂ්ටාචාරයෙනි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට හිස්තැන්ට සුදුසු පිළිතුර යොදා සම්පූර්ණ කරන්න.**

(16) මිනිසා දඩයම් කිරීම වෙනුවට ගස්වල ගෙඩි වර්ග අල වර්ග වැඩි වශයෙන් භාවිතා කළේ ............................................ යුගයේ දී ය.

(17) අතීතයේ මෙසපොතේමියාව ලෙස හැඳින් වූ රට වර්තමානයේ හැඳින්වෙන්නේ ............................................ නමිනි.

(18) මෙසපොතේමියානු සමාජයේ ජීවත් වූ උසස් ම පිරිස ලෙස හැඳින් වූයේ ............................................ ය.


(19) මුහුණේ තිබෙන වෙනස්කම් අනුව අප්‍රිකානු ප්‍රදේශවල ජීවත් වන්නේ ............................................ වර්ගය.

(20) වී වගාව මුලින් ම ආරම්භ කරන ලද්දේ ............................................ ය. (ලකුණු 2x20 = 40)

## II කොටස

- **මෙහි පළමු වන ප්‍රශ්නය අනිවර්ය වේ.**
- **තවත් ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සපයන්න.**
- **ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(1) (අ) සපයා ඇති ලෝක සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) B අක්ෂරයෙන් දක්වා ඇති ශිෂ්ටාචාරය නම් කරන්න.
(ii) C අක්ෂරයෙන් දක්වා ඇති ශිෂ්ටාචාරය නම් කරන්න.
(iii) මොංගොලොයිඩ් මානව වර්ගය ජීවත් වන චීනය දක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?
(iv) කෝකසොයිඩ් මානව වර්ගය ජීවත් වන ඕස්ට්‍රේලියාව දක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 4)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



(ආ) (i) මෙම රූපයේ දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය අයත් ශිෂ්ටාචාරය කුමක් ද?

(ii) මෙය පිහිටා ඇති නගරය නම් කරන්න.

(iv) මෙම දේවාලයේ ජීවත් වන්නේ කුමන පුද්ගලයන් ද? (ලකුණු 4)



(ඉ) (i) මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙය පිහිටා ඇති නගරය කුමක් ද?

(iii) මෙය කුමන ශිෂ්ටාචාරයට අයත් වී ද?

(iv) මෙහි තැන්පත් කළේ කාගේ මළ සිරුරු ද? (ලකුණු 4)

(2) (i) ඉතිහාසය ඉගෙනීමේ දී වැදගත් වන සාහිත්‍ය මූලාශ්‍ර 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(ii) (a) ඉතිහාසය ඉගෙනීමේ දී විවිධ සිදුවීම් අයත් කාලය මැනීමට සුලභව භාවිත වන ක්‍රම 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ක්‍රි. ව. 78 දී ඉන්දියාවේ බටහිර ප්‍රදේශ පාලනය කළේ කුමන රජු විසින් ද? (ලකුණු 2)

(iii) (a) ඔබේ පාසලේ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍ර 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ඉතිහාසය ඉගෙනීමෙන් ඇති වන ප්‍රයෝජන 3ක් ලියන්න. (ලකුණු 3)

(3) (i) පහත සඳහන් සිද්ධීන් පෘථිවියේ ඇති වූ යුගය පිළිවෙළින් නම් කරන්න.

A - පෘථිවියේ ජලයේ මුල් ම ජීවීන් බිහි වූ යුගය -

B - මුලින් ම ගොඩබිම ශාක පැතිරුන යුගය - (ලකුණු 3)

(ii) පහත සඳහන් ක්‍රියාවන් සිදු කළ මානවයන් නම් කරන්න.

A - දෙපයින් ඇවිදයාමේ හැකියාව -

B - මුවහත් ගල් මෙවලම් භාවිතය -

C - ගින්දර සොයා ගැනීම -

D - අප කාගේත් ළඟ ම නෑයා - (ලකුණු 4)

(iii) (a) වානර පවුලකින් මානව පරම්පරාවක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුවක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) මිනිසා ගින්දර සොයා ගැනීමත් සමග ඇති වූ වාසි 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

(4) (i) මිනිසා භාවිතා කළ ගල් මෙවලම් වල ස්වරූපය අනුව මිනිසාගේ සංස්කෘතික දියුණුව බෙදා ඇති යුග 3 නම් කරන්න. (ලකුණු 3)

(ii) ගොවිතැන ආරම්භ වූ හොලොසීන යුගයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් 4ක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) මධ්‍ය ශිලා යුගයේ මිනිසා තම ජීවන කටයුතු සිදු කළ ආකාරය පිළිබඳ කරුණු 2ක් මගින් විස්තර කරන්න. (ලකුණු 5)

(5) (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් වන රටවල් දෙක නම් කරන්න. (ලකුණු 3)

(ii) (a) මෙම ශිෂ්ටාචාරය පිහිටා ඇති ප්‍රධාන ගංගාව කුමක් ද? (ලකුණු 2)

(b) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිහිටි ප්‍රධාන නගර දෙක නම් කරන්න. (ලකුණු 2)

(iii) (a) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් පූජක මූර්තියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු ශිෂ්ටාචාරයක් ලෙස පැවති බවට ලැබෙන සාධක 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(6) (i) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා ඇති ගංගා 2ක නම් කරන්න. (ලකුණු 3)

(ii) මෙසපොතේමියානු සමාජය ප්‍රධාන කොටස් හතරකට බෙදා තිබුණි. ඒවා නම් කරන්න. (ලකුණු 4)

(iii) (a) මෙසපොතේමියානු වැසියන් වැඳුම් පිදුම් කළ ස්වාභාවික වස්තූන් 2ක නම් කරන්න. (ලකුණු 2)

(b) මෙසපොතේමියානු වැසියන් ඇදහූ පහත සඳහන් ස්වභාවික සිද්ධීන්ට අදාළ දෙවිවරු නම් කරන්න.

දේව මණ්ඩලයේ ප්‍රධානියා වූයේ - -

පොළොවට අධිපති දෙවියා වූයේ -

සුළඟට හා ගොවිතැනට අධිපති දෙවියා - (ලකුණු 3)

(7) (i) ඊජිප්තු ශිෂ්ටාචාරයේ පැවති ගංගාව නම් කරන්න. (ලකුණු 3)

(ii) (a) ඊජිප්තු ශිෂ්ටාචාරය පාලනය කර රජවරු දෙදෙනෙකු හා ඔවුන්ගේ පෙළපත සඳහන් කරන්න. (ලකුණු 3)

(b) ඊජිප්තු වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කුමක් ද? (ලකුණු 1)

(iii) (a) ඊජිප්තු වැසියන් ලොවට දායද කළ විශිෂ්ට නිර්මාණ 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) නොෆාටිටී රැජින ඊජිප්තු ශිෂ්ටාචාරයේ වැදගත් තැනැත්තියක් ලෙස සැලකීමට බලපා ඇති හේතු 2ක් සඳහන් කරන්න. (ලකුණු 3)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk